# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.03.08 පැය 1455 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/409/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකය.**

2026.03.08 වන අද දින උදෑසන ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල උප ඒකකයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද විදේශීය දුම්වැටි 34000 ක් **(කාටුන් 170)** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 24 ක් වන මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන් තොටුපොල ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ මහනුවර උප ඒකකය.**

2026.03.07 දින සවස දවුලගල පොලිස් වසමේ හන්දෙස්ස ප්‍රදේශයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ මහනුවර උප ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 100 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන දවුලගල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු අවුරුදු 27 ක් වන හන්දෙස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දවුලගල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. කාර් රථයක් පදිකයෙකුගේ ගැටී පදිකයා ජීවිතක්ෂයට - දෙහිවල පොලිස් වසම.**

2026.03.07 දින රාත්‍රී දෙහිවල පොලිස් වසමේ දෙහිවල දෙස සිට මුහුදුබඩ මාර්ගයේ වැල්ලවත්ත දෙසට ධාවනය වූ කාර් රථයක් මාර්ගය හරහා ගමන්කල පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදිකයා කලුබෝවිල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 78 ක් වූ නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙහිවල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**